# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,041 - 2017 ඔක්තෝබර් මස 13 වැනි සිකුරාදා - 2017.10.13**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 1832 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | 1835 |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බදු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපළ් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


සැ. යු. - (i) පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත 2017 සැප්තැම්බර් මස 29 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) ප්‍රපාතන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත් කෙටුම්පත 2017 ඔක්තෝබර් මස 06 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(iii) ආරක්ෂණ පියවර පනත් කෙටුම්පත 2017 ඔක්තෝබර් මස 06 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2017 නොවැම්බර් මස 02 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2017 ඔක්තෝබර් මස 27 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*

2017 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# පළාත් සභා නිවේදන

## පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව වයඹ පළාත

### මුන්දලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අන්සතු කිරීමට ඇති ඉඩම් සඳහා අවසරපත්‍ර ලැබීමට ගොවි පන්තියේ නොවන තැනැත්තන් තෝරා ගැනීම සඳහා වූ ඉඩම් කච්චේරි පිළිබඳ වූ නිවේදනයයි

01. පහත විස්තර කර ඇති ඉඩම් සඳහා ඉල්ලුම්පත්‍ර සලකා බැලීම සහ ඒවායේ ඉඩම් කොටස් සඳහා අවසර පත්‍ර ලැබීමට සුදුසු තැනැත්තන් තෝරා ගැනීමට මුන්දලම ප්‍රාදේශීය ලේකම්වරයා විසින් 2018/01/19 දින පෙ.ව. 9.00ට මුන්දලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී රජයේ ඉඩම් ආඥාපනත යටතේ ඉඩම් කච්චේරියක් පවත්වනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

*(අ)* දිස්ත්‍රික්කය : පුත්තලම
*(ආ)* ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය : මුන්දලම
*(ඇ)* ග්‍රාම නිලධාරි කොට්ඨාසය : 609 මදුරන්කුලිය
*(ඈ)* ඉඩම පිහිටි ගම : මදුරන්කුලිය
*(ඉ)* ඉඩමේ නම : මදුරන්කුලි කානි
*(ඊ)* ඉඩමේ පිහිටීම : මුන්දලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ
*(උ)* අන්සතු කිරීමට ඇති ඉඩමේ ස්වභාවය : වාණිජ කටයුතු සඳහා
*(ඌ)* අන්සතු කරනු ලබන ඒකකය : පර්චස් 02 සිට 15 දක්වා

02. 2008/04 චක්‍රලේඛය අනුව රජයේ ඉඩම් ආඥාපනත යටතේ ඉඩම් ලබා ගැනීම සඳහා ලියාපදිංචි වී ඇති පුද්ගලයන්ගෙන් ලැබෙන ඉල්ලුම්පත් සලකා බලනු ලැබේ. ඉහත ආදයම් කාණ්ඩයට අයත් වන බව සනාථ කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නියම කරනු ලැබිය හැකි සාධක ඉල්ලුම්කරුවන් විසින් ඉදිරිපත් කළ යුතුය.

03. සියලුම ඉල්ලුම්පත්‍ර 2017/12/25 වැනි දින හෝ ඊට පෙර ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, මුන්දලම යන ලිපිනයට ලැබීමට සැලැස්විය යුතුය. සියලුම ඉල්ලුම්පත්‍ර නියමිත ආකෘතියෙන් ඉදිරිපත් කළ යුතුය.

04. ඉල්ලුම්කරු ඉඩම ලැබීම සඳහා සලකා බලනු ලැබීමට සුදුසුවන්නේ නම් 2018/01/19 වැනි දින පෙ.ව. 9.00 ට මුන්දලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී පැවැත්වෙන ඉඩම් කච්චේරියට පැමිණෙන ලෙස ප්‍රාදේශීය ලේකම්වරයා ඔහුට හෝ ඇයට නියම කරනු ලැබේ. ඉඩම් ලැබීම සඳහා සලකා බලනු ලැබීමට කැමති සෑම ඉල්ලුම්කරුවෙකුම පෞද්ගලිකව පැමිණිය යුතුය. එසේ නැතහොත් තමන් නියෝජනය කිරීම සඳහා වෙනත් අයෙක් ලියවිල්ලක් මඟින් ඉදිරිපත් කළ යුතුය.

05. ඉල්ලුම්කරු හෝ ඔහු නියෝජනය කරනු තැනැත්තා හෝ විසින් ඉල්ලුම්පත්‍රයේ සඳහන් කර ඇති තොරතුරු සනාථ කරන සියලුම සාධක හෝ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නියම කරනු ලබන වෙනත් අදාළ තොරතුරු ඉඩම් කච්චේරියේදී ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

06. අවසරපත්‍රයක් ලැබීමට තෝරාගනු ලබන සෑම තැනැත්තෙක්ම එසේ තෝරා ගනු ලැබූ බව දන්වන ලැබූ වහාම තෝරා ගනු ලැබ ඇත්තේ කවර ඉඩමක් සඳහා වුවද එම ඉඩම වෙනුවෙන් නියම කරනු ලැබූ මුදලක් තැන්පත් කළ යුතුවේ. මෙම තැන්පතුව ආපසු නොගෙවනු ලබන නමුත් තේරුණු තැනැත්තා විසින් ගෙවිය යුතු ගැනුම් මිලට හිලව් කරනු ලැබේ.

07. ඉහත සඳහන් ඉඩම් කච්චේරිය පිළිබඳ විස්තර පහත නම් සඳහන් නිලධාරීන්ගෙන් ඔවුන් ඉදිරියෙන් දක්වා ඇති ස්ථාන වලදී ලබා ගත හැක.

(i) පළාත් ඉඩම් කොමසාරිස් (වයඹ), පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව, කුරුණෑගල.

(ii) ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, මුන්දලම.

ඩී. එම්. කේ. සී. දිසානායක,
පළාත් ඉඩම් කොමසාරිස් (වයඹ).

2017 සැප්තැම්බර් මස 25 වැනි දින දී ය.
ඉල්ලුම්පත්‍රයේ සහ දිවුරුම් ප්‍රකාශයේ ආදර්ශ ආකෘතිය පහතින් දක්වා ඇත.

**රජයේ ඉඩම් ආඥාපනත යටතේ නේවාසික හා කෘෂිකාර්මික කටයුතු සඳහා ඉඩම් ලබා දීමට ඉඩම් කච්චේරි අතරින් තෝරාගනු ලැබීම සඳහා ඉල්ලුම්පත්‍රය**

01. සම්පූර්ණ නම :————————————.
02. ජාතික හැඳුනුම්පත් අංකය :————————————.
03. (I) ලිපිනය :————————————.
(II) ඡන්ද බලය ලබා ඇති මැතිවරණ කොට්ඨාසය :————————————.
(III) ග්‍රාම නිලධාරි කොට්ඨාසය :————————————.
04. ගෘහ මූලික අංකය :————————————.
05. ස්ත්‍රී/ පුරුෂ භාවය :————————————.
06. වයස (අයදුම්පත් භාරගන්නා අවසන් දිනට) :————————————.
07. උපන් දිනය :————————————.
08. විවාහක/ අවිවාහක බව :————————————.
09. රැකියාව :————————————.
10. රැකියාව කරන ස්ථානය :————————————.
11. අයදුම්කරු කලත්‍රයා (පුරුෂයා හෝ භාර්යාව) ඇතුලු මුලු පවුලේ ආදායම:

| නම | අයදුම්කරුට ඇති සම්බන්ධය | රැකියාව | වාර්ෂික ආදායම |
|---|---|---|---|
| (1) | | | |
| (2) | | | |
| (3) | | | |
| (4) | | | |
| (5) | | | |

12. ඉල්ලුම්කරු හා යැපෙන්නන් සතු ඉඩම්වල විස්තර:

| ඉඩමේ නම | ප්‍රමාණය | අයිතියේ ස්වභාවය | හවුලේ පරවේණි ඉඩමක් නම් පවුලේ අයට හිමි කොටස් |
|---|---|---|---|
| (1) | | | |
| (2) | | | |
| (3) | | | |

(නිවාස හා දේපල උපරිම පනත යටතේ දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතු ය)

13. කලත්‍රයා (පුරුෂයා හෝ භාර්යාව) රජයේ සේවකයෙකු හෝ සන්නද්ධ හමුදවක සේවය කරන්නේ නම් ඔහුගේ/ ඇයගේ රාජකාරි ලිපිනය :————————————
14. දැනට තමා පදිංචි නිවසේ තත්වය :————————————.
(තමාගේ ද?/ බද්දට ද?/ අනවසරයෙන් ද? යන වග)
15. නිවස පිහිටි ස්ථානය :————————————.
16. යැපෙන දරුවන් පිළිබඳ විස්තර :————————————.
17. ඉගෙනුම ලබන දරුවන් පිළිබඳ විස්තර :————————————.

| *නම* | *වයස* | *ඉගෙනුම ලබන පාසලේ නම* | *ඉගෙනුම ලබන පන්තිය/ ශ්‍රේණිය* |
|---|---|---|---|
| (1) | | | |
| (2) | | | |
| (3) | | | |
| (4) | | | |

18. ඔබ හෝ කලත්‍රයා විසින් ඉඩමක් හෝ නිවසක් මිලදී ගැනීම සඳහා රජයෙන් හෝ සේවය කරන ආයතනයෙන් ණය මුදලක් ලබා ගෙන ඇත් ද? එසේ නම් පහත විස්තර සපයන්න.
    1. ලබාගත් ණය මුදල :——————————.
    2. ණය ලබාගත් ආයතනයේ/ දෙපාර්තමේන්තුවේ නම :——————————.
    3. දැනට ගෙවීමට ඇති ශේෂය :——————————.

19. පවුලේ යම් සාමාජිකයෙකු මුදල් ඉතිරි කර තිබේ ද? තිබේනම් පහත විස්තර සපයන්නඃ

| *පවුලේ සාමාජිකයාගේ නම* | *ඉතිරිකිරීමේ ගිණුම පවත්වාගෙන යන ආයතනය* | *ඉතිරි කළ මුදල* |
|---|---|---|
| (1) | | |
| (2) | | |
| (3) | | |

20. ඉඩම්ලාභියෙකු වශයෙන් යථා කාලයේදී තෝරාගනු ලැබුවහොත් ඉඩමේ වටිනාකම රජය තීරණය කරනු ලබන අන්දමට ගෙවීමට එකග වන අතර ඉඩම බදු ගැනීමෙන් අනතුරුව මාස 06 ක කාල සීමාවක් තුළ ඉඩම ප්‍රමාණවත් පරිදි සංවර්ධනය කිරීමට එකග වෙමි. ඉදිරිපත් කරන තොරතුරු තෝරා ගැනීමෙන් පසුව වුවද අසත්‍ය බව හෙළි වුවහොත් මාගේ තෝරා ගැනීම ඕනෑම අවස්ථාවක අවලංගු කළ හැකි බවත් දනිමි.

——————————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————.

ඉහත අයදුම්කරු විසින් ඡේද 1 සිට 19 දක්වා ප්‍රකාශ කර ඇති තොරතුරු මා පරීක්ෂා කළ බව ද එම තොරතුරු මා දන්නා තරමින් නිවැරදි බව ද මෙයින් සහතික කරමි.

——————————.
ග්‍රාම නිලධාරිගේ අත්සන

නම :——————————. :
ග්‍රාම නිලධාරි කොට්ඨාසය:——————————.

අනු අත්සන් කරමි.

——————————.
ප්‍රාදේශීය ලේකම්ගේ අත්සන

***දිවුරුම් ප්‍රකාශය***

........................................................................දිස්ත්‍රික්කයේ ................................................ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ .. ..........................................ග්‍රාම නිලධාරි වසමේ ........................................................................................ පදිංචි ........................................... ..................................වන මම පහත සඳහන් පරිදි දිවුරා ප්‍රකාශ කරමි.

(1) මට ද, මාගේ කලත්‍රයාට ද සහ වයස අවුරුදු 18 ට අඩු මාගේ දරුවන්ට ද සාමූහිකව ශ්‍රී ලංකාව තුළ (රජයේ ඉඩම් සහ පුද්ගලික ඉඩම්ද ඇතුළුව) අක්කර 50 කට (පනහකට) අඩුවෙන් තිබෙන සහ 1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 18 වන වගන්තිය යටතේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසමට හෝ 1973 අංක 01 දරන නිවාස දේපල උපරිම පනත යටතේ හෝ ප්‍රකාශයක් කර නැති බවට ද සහතික කරමි.

(2) එසේම ඉහත කී අක්කර .......... රූඩ්........... පර්........ ක් වූ ඉඩම් පවරා ගැනීමෙන්, මිලදී ගැනීමෙන් පසුව වුව ද ඉහත ඡේදයේ සඳහන් කර ඇති අක්කර පනහේ (50) සීමාව නොඉක්මවන බවත් වැඩිදුරටත් මෙයින් සහතික කරමි.

____________________.

" දිවුරුම්කරුගේ අත්සන.

ඉහත සඳහන් දිවුරුම්කරු/ කාරියට මෙහි අඩංගු දෑ කියවා තේරුම් කර දුන් අතර ඔහු/ ඇය මෙහි සඳහන් කරුණු හොඳින් තේරුම් ගැනීමෙන් පසුව මා ඉදිරියේ අත්සන් තැබූ බවත් සහතික කරමි.

____________________.

සාමදාන විනිශ්චයකාර තැන.

10 - 454

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### දකුණු පළාත් රාජ්‍ය සේවයේ සමාජ, සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ සංඥා භාෂා පරිවර්තක III වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2017

1.0 දකුණු පළාත් රාජ්‍ය සේවයේ සමාජ සුභසාධන, පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන බණ්ඩ 2 සේවා ගණයට අයත් තනතුරුවල සංඥා භාෂා පරිවර්තක III වැනි ශ්‍රේණියේ තනතුර සඳහා පුරප්පාඩු 03ක් පවතින අතර, මේ සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා සුදුසුකම්ලත් දකුණු පළාතේ අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය 2017.11.21 දින වන අතර, මෙම විභාගය 2017 දෙසැම්බර් මස ගාල්ල නගරයේ දී පවත්වනු ලබයි.

2.0 *බඳවා ගන්නා ආකාරය :*

දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත කුසලතා අනුපිළිවෙල අනුව සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් බඳවා ගැනීම සිදු කෙරේ.

3.0 *වැටුප :*

අංක 03/2016 හා 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන බණ්ඩ 2 සේවා ගණයට අදාළ වැටුප් කාණ්ඩය MNI-2016 වන අතර මාසික වැටුප් පරිමාණය රු. 27,140 - 10 x 300 - 11 x 350 - 10 x 495 - 10 x 660 - රු. 45,540 වේ. එම චක්‍රලේඛනයේ උපලේඛන II අනුව 2017.01.01 වන දින සිට 2017.12.31 දින දක්වා අදාළ වනුයේ රු.18,728ක මූලික වැටුපක් හා රු. 7,110ක ගැලපුම් දීමනාවකි.

4.0 මෙම තනතුර ස්ථිරය.

5.0 *සුදුසුකම් :*

5.1 *අධ්‍යාපන සුදුසුකම් :*

*(අ)* සිංහල/දෙමළ/ ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථ සහිතව එකවර විෂයයන් හයකින් අ.පො.ස. (සා/පෙ.) විභාගය සමත්වී තිබීම.

සහ

*(ආ)* අ.පො.ස. (උ/පෙ.) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් එකක්වත් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්වී තිබීම.

5.2 *වෘත්තීය සුදුසුකම් :* මහරගම ජාතික අධ්‍යාපන ආයතනය මගින් පවත්වන සංඥා භාෂා පරිවර්තනය පිළිබඳ එක් අවුරුදු පාඨමාලාව හදාරා ලබා ගත් සහතිකයක් තිබීම.

5.3 *පළපුරුද්ද :* අදාල නොවේ.

5.4 *කායික සුදුසුකම් :* දකුණු පළාතේ කවර ප්‍රදේශයක වුවද සේවය කිරීමට යෝග්‍ය වන යහපත් මානසික හා මනා ශාරීරික සෞඛ්‍යය තත්ත්වයකින් යුක්ත විය යුතුය.

5.5 *වෙනත් සුදුසුකම් :*

*(අ)* අයදුම්කරුවන් පූර්වාසන්න වසර තුනක කාලය තුළ දකුණු පළාත් සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිය ඇති ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය. (පදිංචිය ඡන්ද හිමි නාම ලේඛනයක සහතික කළ උද්ධෘතයක් මගින් සනාථ කළ හැකි විය යුතුය.)

*(ආ)* අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

*(ඇ)* තනතුරට බඳවා ගැනීම ගැනීම සඳහා අවශ්‍ය සියළු සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/*ගැසට්* පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

6.0 *වයස :*

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 30ට නොවැඩි විය යුතුය.

7.0 *විභාග පරිපාටිය :-*

**සිංහල/ දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යවලින් මෙම විභාගය පැවැත්වෙන අතර, ඉල්ලුම්කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.**

7.1 විභාගය/වෘත්තීය පරීක්ෂණය පිළිබඳ විස්තර සහ විෂය නිර්දේශයඃ

| | *ප්‍රශ්න පත්‍රය* | *විෂයය නිර්දේශය* |
|---|---|---|
| 1. | අභියෝග්‍යතා පරීක්ෂණය | අපේක්ෂකයාගේ භාෂා හැකියාව, තර්කන ශක්තිය හා ගණිතමය හැකියාව පරීක්ෂා කිරීම සඳහා සකස් කරනු ලබන ප්‍රශන පත්‍රයකි. |
| 2. | සාමාන්‍ය දැනීම | ජාතික හා ජාත්‍යන්තර, සමාජ, ආර්ථික, දේශපාලන හා කාලීන තොරතුරු ඇතුළත් ප්‍රශ්න පත්‍රයකි. |

පත්වීම් සඳහා සුදුසකම් ලැබීමට එක් එක් විෂයය සඳහා වෙන් කර ඇති ලකුණුවලින් යටත් පිරිසෙයින් සියයට හතලිහක් (40%) බැගින්වත් අපේක්ෂකයකු විසින් ලබාගත යුතු වන අතර, වෙන් කොට ඇති පුරප්පාඩු ගණන සපුරාලන පරිදි ලබාගත් ලකුණු අනුපිළිවෙල තරයේ ම අනුගමනය කරමින් කායික යෝග්‍යතාවය සහ සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයක් මගින් බඳවා ගනු ලැබේ.

ලිඛිත විභාගයේ ප්‍රතිඵල සියලුම අයදුම්කරුවන් වෙත නිකුත් කරනු ඇත.

8.0 *විභාග ගාස්තු :-* විභාග ගාස්තුව රු. 400/-කි. මෙම මුදල දකුණු පළාත් ප්‍රධාන ලේකම්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13ට බැරවන ලෙස දකුණු පළාත තුළ පිහිටි ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවා අයදුම්කරුගේ නමින් වූ ලදුපත අයදුම්පතේ අදාළ කොටුවේ නොගැළවෙන සේ ඇලවිය යුතු ය. (ලදුපතේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගත යුතු ය.) කිසිම හේතුවක් නිසාවත් විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර, විභාග ගාස්තුව සඳහා මුද්දර හෝ මුදල් ඇණවුම් භාරගනු නොලබන අතර, තැපැල් හෝ උප තැපැල් කාර්යාලවලට ගෙවන ලද මුදල් ද භාරගනු නොලැබේ.

9.0 අයදුම්පත්‍ර :- ඒ 4 (සෙ.මී.21x29) (සාමාන්‍ය හාෆ්ෂීට්) ප්‍රමාණයේ කඩදාසි භාවිත කරමින්

*(අ)* අංක 01 සිට 03 තෙක් ඡේදයන් පළමුවන පිටුවට ද,

*(ආ)* **අංක 04 සිට ඉදිරියට වන ඡේදයේ අනෙක් පිටුවලට ද, ඇතුළත්වන සේ කඩදාසියේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත්‍රය පිළියෙල කරගත යුතු අතර අපේක්ෂකයා** විභාගයට පෙනී සිටීමට අදහස් කරන භාෂාවෙන්ම අයදුම්පත්‍රය පිරවිය යුතු ය.

නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරාගත යුතුය. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇති අතර, සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය විභාග නිවේදනයේ දැක්වෙන අයදුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු වේ. එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැක. අයදුම්පත් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය වන www.psc.sp.gov.lk මගින්ද ලබා ගත හැකිය.

*සැලකිය යුතුය* -

විභාගයට පෙනී සිටින දිස්ත්‍රික්කය ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය විය යුතුය. යම් දිස්ත්‍රික්කයකට ඉල්ලුම් කළ අපේක්ෂකයන් ගණන ප්‍රමාණවත් නොවේ නම් වෙනත් දිස්ත්‍රික්කයක් වෙත යොමු කරනු ලැබේ. කෙසේ වුවද එකී දිස්ත්‍රික්ක සියල්ලෙහිම හෝ වැඩි ගණනක හෝ ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොමැති වුවහොත් විභාගය ගාල්ල දිස්ත්‍රික්කයේදී පමණක් පැවැත්වීමට දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කටයුතු කරනු ඇත.

9.1 *ගැසට් නිවේදනයේ* සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත විභාග ගාස්තු ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර හෝ සෑම අතින්ම සම්පූර්ණ අයදුම්පත්‍ර සකස් කර ඇති සියලු අයදුම්කරුවන්ට තරග විභාගයට පෙනී සිටීමට දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ලැබේ. තරග විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සළකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා *ගැසට් නිවේදනය* අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

9.2 අයදුම්පත්‍රය බහා එවන කවරයේ වමත්පස ඉහළ කෙළවරේ "දකුණු පළාත් රාජ්‍ය සේවයේ සමාජ සුභසාධන, පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ සංඥා භාෂා පරිවර්තක III වැනි ශ්‍රේණියේ තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - .......................... දිස්ත්‍රික්කය" යන්න සඳහන් කරන්න.

9.3 අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරිවරයකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියකු, වාර්ෂික වැටුප රු. 240,360/-ක් හෝ ඊට වැඩි රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතු ය.

9.4 සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය 2017 නොවැම්බර් මස 21 දින හෝ ඊට පෙර පහත දැක්වෙන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතු ය.

ලේකම්,
දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
6 වන මහළ, දිස්ත්‍රික් ලේකම් කාර්යාල සංකීර්ණය, ගාල්ල.

10.0 *විභාගයට පෙනී සිටීම* :- අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහා ම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා නිල වෙබ් අඩවියේ පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2ක් හෝ 3ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත දන්වා සිටිය යුතු ය. "ඔබ වෙත තබාගත් පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද කුවිතාන්සියේ පිටපත සහ ඉල්ලුම්පත්‍රය තැපෑලෙන් යොමු කිරීමේදී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද අතැතිව විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය සඳහන් කරමින් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් විමසන ලෙස දන්වන අතර, ෆැක්ස් මගින් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ලබා ගැනීමට ඔබගේ ෆැක්ස් අංකය ද සමග ඉහත ඔබගේ විස්තර ඇතුලත් ඉල්ලීම් ලිපියක් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ෆැක්ස් මගින් යොමුකරමින් විමසා සිටීමද වඩාත් ප්‍රතිඵලදායී වනු ඇත.

අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් සේ නොසැලකිය යුතු ය. සෑම අපේක්ෂකයකුම විභාගය ආරම්භ වන දිනයේ ශාලාධිපති වෙත තම අත්සන සහතික කරන ලද ප්‍රවේශ පත්‍රයක් ඉදිරිපත් කළ යුතු ය.

11.0 අපේක්ෂකයින්ගේ අනන්‍යතාව සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය:

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

12.0 විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

13.0 මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධව දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම *ගැසට්* නිවේදනයේ සඳහන් පොදු විභාග නීති රීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

යූ. ජී. විදුර කාරියවසම්,
ලේකම්,
දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,

2017 සැප්තැම්බර් මස 26 වැනි දින,
දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,
6 වන මහල,
දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගොඩනැගිල්ල,
ගාල්ල.

**ආදර්ශ අයදුම්පත්‍රය**

*දකුණු පළාත් රාජ්‍ය සේවයේ සමාජ සුභසාධන, පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ සංඥා භාෂා පරිවර්තක III වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2017*

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය [ ]
(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

සිංහල - 2
දෙමළ - 3 [ ]
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය [ ]

1.0 1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමඟ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :- ..................................................................
.........................................................................................................................
(උදා : GUNAWARDHANA H.M.S.K.)

1.2 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :- ..............................................................................
.........................................................................................................................
(උදා : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) : ..............................................................................
.........................................................................................................................

1.4 ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | |

2.0 2.1 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ..............................................................................
.........................................................................................................................

2.2 ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) : ..............................................................................
.........................................................................................................................

2.3 ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :- ..............................................................
.........................................................................................................................

3.0 3.1 ස්ථිර පුරුෂ භාවය : ස්ත්‍රී - 1
පුරුෂ - 0
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

3.2 උපන් දිනය :- වර්ෂය : | | | | | මාසය : | | | දිනය : | | |

3.3 2017.11.21 දිනට වයස : අවුරුදු : | | | මාස : | | | දින : | | |

3.4 අයදුම්කරු ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය : ....................................................................................................................

3.5 දුරකතන අංකය : | | | | | | | | | | |

3.6 විද්‍යුත් තැපැල (E-mail Address) : ....................................................................................................................

4.0 අධ්‍යාපන සුදුසුකම් :

4.1 අ.පො.ස. (සා/පෙළ) විභාගය පිළිබඳ විස්තර (පළමුවන වර) :-

වර්ෂය :.................................... විභාග අංකය :............................................

| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

4.2 අ.පො.ස. (උ/පෙළ) විභාගය පිළිබඳ විස්තර :-

වර්ෂය :.................................... විභාග අංකය :............................................

| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|
| 1. | | 3. | |
| 2. | | 4. | |

5.0 වෘත්තීය සුදුසුකම් :

| ආයතනය | හදාරා ඇති පාඨමාලාව | කාලසීමාව |
|---|---|---|
| | | |
| | | |

6.0 පළපුරුද්ද :

| සේවය කරන ලද ආයතනය | තනතුර | කාලසීමාව |
|---|---|---|
| | | |
| | | |

7.0 ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද?
(අදාළ කොටුවේ √ ලකුණ යොදන්න.) (ඔව් නම් විස්තර සඳහන් කරන්න.) :........................................................................

ඔව් ☐ නැත ☐

8.0 විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර : ..................................................................................
(i) විභාග ගාස්තු ගෙවූ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය : ..................................................................................
(ii) ලදුපත් අංකය හා දිනය : ..................................................................................
(iii) ගෙවූ මුදල : ..................................................................................

ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න.
(ලදුපතේ ඡායාස්ථ පිටපතක් ළඟ තබා ගන්න.)

9.0 *අයදුම්කරුගේ සහතිකය :*

*(අ)* මෙම ඉල්ලුම්පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ / හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳ දරා ගැනීමට එකඟ වෙමි. තව ද, මෙහි සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

*(ආ)* මවිසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත් කරනු ලැබීමට පෙර නුසුදුසුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බව ද මම දනිමි.

*(ඇ)* තව ද, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීතිරීති වලට මම යටත්වන බව ද ප්‍රකාශ කරමි.

*(ඈ)* මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

.................................................,
අයදුම්කරුගේ අත්සන.

දිනය :................................

10.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ............................................. මයා/ මිය/ මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද ඔහු/ ඇය මා ඉදිරිපිට දී ...................................... දින ඔහුගේ/ ඇයගේ අත්සන තැබූ බව ද, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බව ද, එම ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.

......................................,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

දිනය :............................

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :..........................
තනතුර :....................................
ලිපිනය :...........................................................
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)

10-463

**වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

වයඹ පළාත් සභා රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වන ශ්‍රේණියට බඳවා ගැනීමේ
විවෘත තරග විභාගය -2017

1.0 වයඹ පළාත් සභා රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වන ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා සුදුසුකම්ලත් වයඹ පළාතේ ස්ථිර පදිංචි ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් 2017 දෙසැම්බර් මාසයේදී පවත්වන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

2.0 විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල අනුව කුසලතාව මත සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින්, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/90 අනුව වයඹ පළාතට අයත් දිස්ත්‍රික් ජනගහන අනුපාත පදනමින් වයඹ පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වන ශ්‍රේණියේ තනතුරු සඳහා පත් කිරීමට තෝරා ගනු ඇත.

3.0 පත්කරනු ලබන සංඛ්‍යාව සහ පත්වීම ක්‍රියාත්මක වන දිනය වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම පිරවීම හෝ නොපිරවීම හෝ මේ පිළිබඳව අවසාන තීරණය ගැනීමේ බලය වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය.

4.0 *වැටුප* :- අංක 03/2016 හා 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව, රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III, II හා I වැනි ශ්‍රේණිවලට අදළ මාසික වැටුප් පරිමාණය රු. 28,940 - 10 x 300, 11 x 350 - 10 x 560 - 10 x 660 - රු. 47, 990 ක් වන අතර, එම වැටුප ඔබට හිමිවන්නේ 2020.01.01 දින සිට වේ. ඉහත චක්‍රලේඛයේ උපලේඛන II හි විධිවිධාන පරිදි පත්වීම ක්‍රියාත්මක වන දින සිට වැටුප් ගෙවනු ලැබේ. (රු. 31,940 න් ඔබ්බට යාම සඳහා II වැනි පන්තියට උසස් වීම ද, රු. 35,790 න් ඔබ්බට යාම සඳහා I වැනි ශ්‍රේණියට උසස් වීමද ලබා ගත යුතුය.)

5.0 මෙම තනතුර ස්ථිරය. මෙම විභාගයෙන් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III ශ්‍රේණියට පත්වන නිලධාරීන්ට හිමි විශ්‍රාම වැටුප, විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණය අනුව තීරණය කරනු ලැබේ.

5.1 මෙම පත්වීම අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් ය. රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වන ශ්‍රේණියට බඳවා ගෙන වසර 03 ක් ඇතුළත සේවා ව්‍යවස්ථාවේ සඳහන් පරිදි පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.

5.2 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 ට අනුව හා ඊට ආනුශාංගික චක්‍රලේඛ අනුව සේවයට බැඳී වසර 05 ක් ඇතුළත සේවයට බැඳුන භාෂා මාධ්‍යයට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව/භාෂා පිළිබඳ ප්‍රවීනතාව ලබාගත යුතු ය.

6.0 *සුදුසුකම්* :- වයඹ පළාත් සභා රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වන පන්තියේ තනතුරුවලට බඳවා ගැනීම සඳහා පහත සඳහන් සුදුසුකම් අදළ වේ.

*(අ)* වයඹ පළාත් සභා බල ප්‍රදේශය තුළ අයදුම්පත් කැඳවන දිනට අවම වශයෙන් වසර තුනක් (03ක්) ස්ථිර පදිංචිය ඇති ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.

*(ආ)* අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු දහඅට (18) ට නොඅඩු හා අවුරුදු තිහ (30)ට නොවැඩි විය යුතුය. (ඒ අනුව 1999.11.14) දිනට හෝ ඊට පෙර හා 1987.11.14 දිනට හෝ ඊට පසුව උපන් දිනය යෙදී ඇත්නම් පමණක් අයදුම් කිරීම සඳහා අවශ්‍ය වයස සම්බන්ධව සුදුසුකම් සපුරාලනු ඇත.)

*(ඇ)* යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.

*(ඈ)* පහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.

(1) සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය ඇතුළුව විෂයයන් හතරකට (04) සම්මාන සාමාර්ථයන් සහිතව එක්වරක දී විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම;

සහ

(2) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී සියලුම විෂයයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා සාමාන්‍ය ඉංග්‍රීසි හැර) එකවර සමත්ව තිබීම. පැරණි විෂය නිර්දේශය යටතේ විෂයයන් 03 කින් එක්වර සමත්ව තිබීම ප්‍රමාණවත් වේ.

සෑම අයදුම්කරුවකුම තනතුරට අදළ සුදුසුකම් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ ඊට පෙර හෝ සම්පූර්ණ කර තිබීම අනිවාර්යය වේ.

7.0 *(අ)* දිස්ත්‍රික් ජනගහන අනුපාත පදනම මත තෝරා ගැනීම:

සේවයට බඳවා ගැනීම නියෝජනාත්මක පදනමක් මත කෙරෙනු ඇත. වයඹ පළාත් සහා බල ප්‍රදේශයට අයත් එක් එක් පරිපාලන දිස්ත්‍රික්කයක ජන සංඛ්‍යාවට සමානුපාතිකව එම එක් එක් පරිපාලන දිස්ත්‍රික්කය සඳහා පුරප්පාඩු සංඛ්‍යාවෙන් නියමිත ගණනක් වෙන් කරනු ලැබේ. යම් දිස්ත්‍රික්කයකින් පිරවිය යුතු පුරප්පාඩු සංඛ්‍යාව සඳහා තරග කිරීමට සුදුස්සන් වනුයේ එම දිස්ත්‍රික්කයෙන් ඉල්ලුම් කරන අයදුම්කරුවන් පමණි.

(i) යම් දිස්ත්‍රික්කයකට ඉහත සඳහන් පරිදි වෙන් කළ පුරප්පාඩු සංඛ්‍යාව එම දිස්ත්‍රික්කය සඳහා ඉල්ලුම්කරන ලද සුදුසුකම් සපුරාලන ලද අයදුම්කරුවන්ගෙන් පිරවිය නොහැකි අවස්ථාවලදී, එම පුරප්පාඩු සංඛ්‍යාව යාබද දිස්ත්‍රික්කයට ලබා දෙනු ඇත.

*(ආ)* දිස්ත්‍රික්කයට අයත් වීම සඳහා තිබිය යුතු සුදුසුකම් :

දිස්ත්‍රික්කයක පුරප්පාඩු සඳහා තරග කිරීමට නම් අපේක්ෂකයා පහත සඳහන් කරුණු අතරින් එකක් හෝ සපුරා තිබිය යුතුය.

(i) විභාගය සඳහා සුදුසුකම් සම්පූර්ණ කළ යුතු අවසන් දිනයට පූර්වයෙන් වූ අවුරුදු පහක් (05) ක් ඇතුළත ඔහු/ඇය එම දිස්ත්‍රික්කය තුළ යටත් පිරිසෙයින් අවුරුදු තුනක් (03) ක් වත් අඛණ්ඩව ස්ථිර වශයෙන් පදිංචි ව සිටි අයෙකු විය යුතුය.
එසේ *නැතහොත්,*

(ii) ඔහු/ඇය නොකඩවා අවුරුදු පහක් (05) ක් එම දිස්ත්‍රික්කයෙහි ස්වකීය ද්විතියික පාසල් අධ්‍යාපනය ලබා තිබිය යුතුය.

*(ඇ)* අයදුම්කරුවන් ඉහත (ආ) (ii) යටතේ තමන් අයත් දිස්ත්‍රික්කය සනාථ කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කරන ලද ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරන ලද පදිංචි සහතිකය ඉල්ලා සිටින අවස්ථාවක ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය.

***සටහන*** - 1 යම් අපේක්ෂකයකුගේ පියා හෝ මව හෝ රජයේ, පළාත් සහා රාජ්‍ය සේවයේ හෝ සංස්ථාවක මාරු කළ හැකි සේවයක යෙදී සිටියේ නම් එම අපේක්ෂකයාට තමාගේ, තම පියාගේ හෝ මවගේ හෝ උපන් ස්ථානය තමා අයත් දිස්ත්‍රික්කය වශයෙන් තෝරා ගැනීමට අවසර දෙනු ලැබේ. (ඒ සඳහා අයදුම්කරු විසින් තම දෙමාපියන්ගේ උප්පැන්න සහතිකය පිටපත් ඉදිරිපත් කළ යුතුය.)

2 කිසිම අපේක්ෂකයකුට එක් දිස්ත්‍රික්කයකට වැඩි ගණනක පුරප්පාඩු සඳහා තරග කිරීමට අවසර දෙනු නොලැබේ. තමන් වඩාත් කැමති දිස්ත්‍රික්කය කවරක් දැයි වරක් සඳහන් කළ පසු එය වෙනස් කළ නොහැකිය.

8.0 *විභාග පටිපාටිය :-*

*(අ)* මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන මාධ්‍යවලින් පැවැත්වේ. අයදුම්කරු තමාට අදාළ එක් එක් මාධ්‍යයක් තෝරා ගත යුතු අතර විභාගයට නියමිත සියලු ප්‍රශ්න පත්‍ර සඳහා එම මාධ්‍යයෙන්ම පිළිතුරු සැපයිය යුතුය. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. විභාග ප්‍රශ්න පත්‍ර දෙකකින් යුක්ත වේ.

| | *ප්‍රශ්න පත්‍රය* | *ලකුණු* | *කාලය* |
|---|---|---|---|
| (01) | භාෂා හැකියාව | 100 යි | පැය 2 1/2 යි. |
| (02) | අභියෝග්‍යතාව | 100 යි | පැය 1 යි. |

*භාෂා හැකියාව* - මෙම ප්‍රශ්න පත්‍රය අයදුම්කරුවන්ගේ අදහස් ප්‍රකාශනය, අවබෝධය, අක්ෂර වින්‍යාස, භාෂාව හා රචනය, දෙන ලද ලිපියන් කෙටුම්පත් කිරීම, සපයා ඇති දත්ත අනුව ප්‍රස්තාර වගු සකස් කිරීම, දී ඇති පාඨ සාරාංශ කිරීම, දී ඇති වාක්‍ය කිහිපයක අදහස් තනි වාක්‍යයකින් ලිවීම සහ සරල ව්‍යාකරණ භාවිතය පිළිබඳ දැනුම පරීක්ෂා කෙරෙන විෂයානුබද්ධ ප්‍රශ්නවලින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

*අභියෝග්‍යතාව* - මෙම ප්‍රශ්න පත්‍රය අයදුම්කරුවන්ගේ සංඛ්‍යාමය හැකියාවන්, තර්කන ශක්තිය, සාමාන්‍ය බුද්ධිය ආදිය මැනෙන අයුරින් සැකසෙන විෂයානුබද්ධ ප්‍රශ්නවලින් සමන්විත වේ. බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50 කින් යුක්ත වන අතර, ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

*සටහන :*

I. රාජකාරි කටයුතු සඳහා අයදුම්කරුවන්ගේ සුදුසුකම් හා හැකියා පරීක්ෂා කිරීම පිණිස මෙම ප්‍රශ්න පත්‍ර සකස් කෙරේ.

II. සෑම ලිඛිත පිළිතුරු පත්‍රයක් සම්බන්ධයෙන්ම නොපැහැදිලි අත් අකුරු හා වචනවල අක්ෂර වින්‍යාසය පිළිබඳ වැරදි සම්බන්ධයෙන් ලකුණු අඩු කරනු ලැබේ.

මෙම විභාගය තරග විභාගයක් වුවද පත්වීම් ලැබීමට සුදුසුකම් ලැබීම සඳහා එක් එක් විෂයය සඳහා වෙන් කර ඇති ලකුණුවලින් යටත් පිරිසෙයින් සියයට හතළිහක් බැගින් වත් (40%) අයදුම්කරුවන් විසින් ලබා ගත යුතු අතර, විභාගයේ මුළු ලකුණු ගණන යටත් පිරිසෙයින් සියයට පනහක් (50%) වත් ලබා ගත යුතු වේ. තරග විභාගය සඳහා වෙන් කොට ඇති පුරප්පාඩු ගණන සපුරාලන පරිදි ලබා ගත් ලකුණු අනු පිළිවෙල තරයේ ම අනුගමනය කරමින් පත් වීම් දෙනු ලැබේ.

9.0 *ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම් :-* ඉල්ලුම් පත්‍රය පිරවීමේ දී ඉතා සැළකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මේ විභාගයේ නීති රීති අනුව යම් අයදුම්කරුවකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගයේ පැවැත්වෙද්දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ හෝ ඇයගේ අයදුම්කාරිත්වය අවලංගු කළ හැකිය.

10.0 *විභාග ගාස්තු :-* සෑම අයදුම්කරුවෙකුම විභාග ගාස්තුවක් විභාග කොමසාරිස් ජනරාල් වෙත ගෙවිය යුතු වේ. විභාග ගාස්තු වශයෙන් රුපියල් හයසියයක් (රු. 600/- ක්) විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදයම් ශීර්ෂ 2003.02.13 යටතේ රජයේ ආදයමට බැර වන පරිදි දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/උප තැපැල් කාර්යාලයකට ගෙවා අයදුම්කරුගේ නමින් ලබාගන්නා ලද ලදුපත එහි එක් දරයක් මගින් අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ අලවා එවිය යුතුය. (ලදුපතේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගත යුතුය) එසේ මුදල් ගෙවා අයදුම්කරුගේ නමින් ම ලබාගත් ලදුපත් හැර වෙනත් ආයතනවලට ගෙවා ලබාගත් ලදුපත් හෝ මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලබන අතර, කුමන හේතුවක් නිසා හෝ ගෙවූ විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන බව සැළකිය යුතුය. එම විභාග ගාස්තු වෙනත් කවර හෝ විභාගයක් සඳහා මාරු කිරීමට ඉඩ දෙනු නොලබන බව ද සැළකිය යුතුය.

11.0 *අයදුම්පත්‍ර :-* මෙම නිවේදනයේ අගට යොදා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව ඒ4 (සෙ.මී. 21x29) (සාමාන්‍ය භාෆ්ෂීට්) ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම භාවිතා කරමින්,

*(අ)* අංක 1.0 සිට 3.1 තෙක් ඡේදයෙන් පළමු වන පිටුවට ද,

*(ආ)* අංක 3.2 සිට ඉදිරියට වන ඡේදයන් අනෙක් පිටුවලට ද ඇතුළත් වන පරිදි අයදුම්පත්‍රය පිළියෙල කර ගත යුතු අතර, ඊට අදළ තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිලිව ඇතුළත් කළ යුතුය.

*(ඇ)* අයදුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලයට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළ ට අමරතව ඉංග්‍රීසියෙන් ද සඳහන් කළ යුතුය.

*(ඈ)* අයදුම්පත්‍රයේ 1.1 යටතේ අයදුම්කරුගේ නම සඳහන් කිරීමේදී අයදුම්කරුගේ සම්පූර්ණ නමෙහි අගටම යෙදෙන කොටස පළමුව ලියා පෙළපත් නාමයට අදළ නම්වල මුලකුරු හා නමෙහි අනෙකුත් කොටස්වල මුලකුරු ඊළඟට වන සේ ලිවිය යුතුය.

*උදා-* අයදුම්පත්‍රයේ 1.2 අනුව සම්පූර්ණ නම - MATHURATA GAMARALALAGE BUDDHIKA SARATH KUMARA GUNAWARDHANA

අයදුම් පත්‍රයේ 1.1 හි GUNAWARDHANA, M.G.B.S.K. ලෙස ලිවිය යුතුයි.

අයදුම්පත්‍ර භාර ගැනීමේ අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් හා ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන හා අසම්පූර්ණ අයදුම්පත්‍ර දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරෙනු ඇත. සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව විමසා බැලීම අයදුම්කරු සතු කරුණකි. නිසි පරිදි අයදුම්පත්‍රය සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරු විසින්ම දරා ගත යුතුය. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. අයදුම්පත්‍රයට වෙනත් සහතික හෝ ලේඛන කිසිවක් අමුණා එවීම නොකළ යුතුය.

12.0 *විභාගය පැවැත්වීමට යෝජිත නගරය හා නගර අංක :*

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| කුරුණෑගල | 01 |
| කුලියාපිටිය | 02 |
| මහව | 03 |
| හලාවත | 04 |
| පුත්තලම | 05 |

*සැ.යු.* -

01. විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කළ නගර පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. යම් නගරයකට ඉල්ලුම් කළ අයදුම්කරුවන් ගණන ප්‍රමාණවත් නොවේ නම් දෙවන කැමැත්ත ලෙස සඳහන් කළ නගරය වෙත යොමු කරන අතර, එම දෙවන නගරය සඳහා ද ප්‍රමාණවත් අයදුම්කරුවන් ගණනක් නොසිටියහොත් යාබද නගරයක් වෙත යොමු කරනු ලැබේ. කිසියම් ආකාරයකින් එවිට ද විභාග මධ්‍යස්ථානයක් පිහිටුවීමට ප්‍රමාණවත් අයදුම්කරුවන් පිරිසක් නොමැති නම් ආසන්න වෙනත් විභාග මධ්‍යස්ථානයක් වෙත ඔවුන් යොමු කරනු ඇත.

02. තෝරා ගන්නා අයදුම්කරුවන් වෙත පත්වීම් නිකුත් කරනු ලබන්නේ අයදුම්පත්‍රයේ සටහන් කරනු ලබන මුලකුරු සමග නමට පමණක් වන බැවින් අයදුම්පත්‍රයේ සඳහන් ආදර්ශය අනුගමනය කරමින් නම නිවැරදිව සඳහන් කළ යුතුය. පත්වීම් නිකුත් කරනු ලබන අවස්ථාවේ නමෙහි සංශෝධනයක් කිරීමට හෝ යම් කොටස් ඇතුළත් කිරීමට/ඉවත් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

12.1 අයදුම්පත්‍රයේ ද, විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන රජයේ විද්‍යාලයක, විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියකු, වාර්ෂික වැටුප රු. 240,360/= ක් හෝ ඊට වැඩි රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතු ය.

12.2 අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"වයඹ පළාත් රාජ්‍ය සේවයේ කළමනාකරණ සහකාර සේවයේ III වන පන්තියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය 2017"** යන්න සහ ඔබ තරග කරන දිස්ත්‍රික්කයත්, භාෂා මාධ්‍යයත් සඳහන් කරන්න.

12.3 නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය 2017.11.14 දින හෝ ඊට පෙර ලැබෙන සේ **විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ. 1503, කොළඹ** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු වේ.

12.4 *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත විභාග ගාස්තු ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර හෝ ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කර ඇති සියලු අයදුම්කරුවන්ට තරග විභාගයට පෙනී සිටීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් ඉඩ දෙනු ලැබේ. තරග විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා *ගැසට්* නිවේදනය අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

13.0 විභාගයට පෙනී සිටීම සඳහා විභාග ප්‍රවේශ පත්‍ර විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරනු ලැබේ. විභාග අයදුම්කරුවන් තම අත්සන සහතික කරවාගත් විභාග ප්‍රවේශ පත්‍ර විභාගයට පෙනී සිටින පළමු දිනයේදීම විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය.

13.1 විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත. නිවේදනය පළවී, අවම වශයෙන් දින දෙකක් හෝ තුනක් ගත වූ පසුවත් තම ප්‍රවේශ පත්‍රය නොලද අයදුම්කරුවෙක් වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන හා විදේශ විභාග ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේදී අයදුම්කරු තමා අයදුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කරන ලද ඉල්ලීම් ලිපියත්, ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබා ගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සහිතව දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කරමින්ම විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේ දී ලියාපදිංචි කළ කුවිතාන්සිය සූදානමින් ළඟ තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

14.0 අයදුම්කරුවන්ගේ අනන්‍යතාව සනාථ කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතාපත්‍රවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

15.0 අයදුම්කරුවකු හට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

15.1 විභාග ප්‍රතිඵල :

මෙම නිවේදනයේ 8.0 ඡේදයේ සඳහන් පරිදි ලිඛිත පරීක්ෂණයෙන් සුදුසුකම් ලබන අයදුම්කරුවන්ගේ මුළු ලකුණු කුසලතාවය මත සකස් කළ ප්‍රතිඵල ලේඛනය, ලේකම්, වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ලබා දෙනු ඇත. අනතුරුව විභාගයට පෙනී සිටින සියළුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීම හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.results.exam.gov.lk වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කරනු ඇත.

16.0 විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට ද ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ගනු ලබන තීරණවලටද, අයදුම්කරුවන් යටත් වේ. එම නීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.
මෙම විභාගය පැවැත්වීම, පත්වීම් ලබාදීම හා අනෙක් සියලුම කරුණු සහ මෙම නිවේදනයේ විධි විධාන සළසා නොමැති කවර කරුණක් පිළිබඳව වුව ද, අවසන් තීරණය වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වන්නේ ය.

17.0 "සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් හෝ නොගැලපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කරනු ලැබේ."

පද්මිණී කාරියවසම්,
ලේකම්,
වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව,

2017 සැප්තැම්බර් මස 28 වැනි දින,
වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
පළාත් සභා කාර්යාල සංකීර්ණය,
කුරුණෑගල.

(මෙම දැන්වීම පදනම් කරගෙන විවිධ ආයතන විසින් සාවද්‍ය ලෙස සකස්කර ඉදිරිපත් කරනු ලබන දැන්වීම්වල සඳහන් කරුණු සහ අයදුම්පත්‍ර කෙරෙහි කිසිදු වගකීමක් දරනු නොලැබේ.)

**ආදර්ශ අයදුම්පත්‍රය**

*වයඹ පළාත් සභා රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වන ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2017*
*Open Competitive Examination for Recruitment to Class III of North Western Provincial Public Management Assistant Service – 2017*

| |
|---|
| |

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය :-
සිංහල - 2 ☐
දෙමළ - 3
ඉංග්‍රීසි - 4 (අදළ අංකය කොටුව තුළ ලියන්න.)

*ගැසට්* නිවේදනය අනුව අයදුම්කරු විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන නගරය හා නගර අංකය සඳහන් කරන්න. (විභාග මධ්‍යස්ථාන පිහිටුවන නගර සහ නගර අංක සඳහා 12.1 ඡේදය බලන්න.)

| | *නගරය* | *නගර අංකය* |
|---|---|---|
| 1 | | |
| 2 | | |
| 3 | | |
| 4 | | |
| 5 | | |

(ඉල්ලුම් කළ නගරය පසුව වෙනස් කළ නොහැක.)

* පුරප්පාඩු සඳහා තරග කරන *ගැසට්* නිවේදනයේ 7.0 වන ඡේදයට අනුකූලව ඔබ පදිංචි දිස්ත්‍රික්කය.
(අදාළ දිස්ත්‍රික්කය හා දිස්ත්‍රික් අංකය කොටුව තුළ ලියන්න.)

| *දිස්ත්‍රික්කය* | *දිස්ත්‍රික් අංකය* |
|---|---|
| | |

(කුරුණෑගල - 01/පුත්තලම - 02)

1.0 නම :-

1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :.........................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)
(උදා : GUNAWARDHANA, H.M.S.K)

1.2 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :.........................................................
(උදා : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

1.3 සම්පූර්ණ නම :.........................................................
(සිංහලෙන්/දෙමළෙන්)

1.4 ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

2.0 2.1 ස්ථිර ලිපිනය :.........................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.2 ස්ථිර ලිපිනය :
(සිංහලෙන්/දෙමළෙන්)

2.3 විභාග ප්‍රවේශපත්‍ර එවිය යුතු ලිපිනය :.........................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

3.0 3.1 ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී - 1
පුරුෂ - 0
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

3.2 උපන් දිනය : වර්ෂය : | | | | | මාසය : | | | දිනය : | | |

3.3 2017.11.14 වැනි දිනට වයස : අවුරුදු : | | | මාස : | | | දින : | | |

3.4 දුරකතන අංකය : | | | | | | | | | | |

4.0 4.1 දිස්ත්‍රික්කයේ පදිංචිව සිටින්නේ කවදා සිට ද? :.........................................................

4.2 පදිංචි උප දිසාපති/ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :.........................................................

4.3 ග්‍රාම නිලධාරි කොට්ඨාසය :.........................................................

5.0 අධ්‍යාපන සුදුසුකම් :

5.1 අ.පො.ස. (සා.පෙළ) විභාගය පිළිබඳ විස්තර :

I. විභාගයේ වර්ෂය හා මාසය :........................................
II. විභාග අංකය :........................................
III. ප්‍රතිඵල :........................................

| | *විෂයය* | *ශ්‍රේණිය* | | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|---|---|
| 1 | | | 6 | | |
| 2 | | | 7 | | |
| 3 | | | 8 | | |
| 4 | | | 9 | | |
| 5 | | | 10 | | |

5.2 අ.පො.ස. (උ.පෙළ) විභාගය පිළිබඳ විස්තර ඃ

I. විභාගයේ වර්ෂය හා මාසය :.......................................................
II. විභාග අංකය :.......................................................
III. ප්‍රතිඵල :.......................................................

| | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|
| 1 | | |
| 2 | | |
| 3 | | |
| 4 | | |

5.3 පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා ඇත්නම්,

I. විශ්ව විද්‍යාලය :.....................................................
II. උපාධිය :.....................................................
III. විභාග වර්ෂය :.....................................................

6.0 වෙනත් සුදුසුකම් :.....................................................

7.0 ඔබ කවරදක කවර චෝදනාවක් සඳහා හෝ උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද? (අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න) (ඔව් නම් විස්තර සඳහන් කරන්න)

ඔව් ☐ නැත ☐

8.0 විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර :

I. විභාග ගාස්තු ගෙවූ තැපැල්/උපතැපැල් කාර්යාලය :.....................................................
II. ලදුපත් අංකය හා දිනය :.....................................................
III. ගෙවූ මුදල :.....................................................

ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න
(ලදුපතේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය)

9.0 *අයදුම්කරුගේ සහතිකය* :

*(අ)* මෙම අයදුම්පත්‍රයේ ම විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කරමි. මෙහි යම් කොටසක් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳදරා ගැනීමට එකඟ වෙමි.

තවද මෙහි සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

*(ආ)* ම විසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත්වන බව ද දනිමි.

*(ඇ)* විභාග ගාස්තු සඳහා වන නියමිත මුදල් ප්‍රාදේශීය ලේකම් වෙත ගෙවා ලබාගත් කුවිතාන්සිය මෙහි අලවා ඇති බවත්, විභාගය සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ගනු ලබන තීරණවලට යටත්වන බවත් මම දනිමි.

*(ඈ)* මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් කිරීමට ඉල්ලීම් නොකරන බවද ප්‍රකාශ කරමි.

.................................................
අයදුම්කරුගේ අත්සන.

දිනය :.................................................

10.0 *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :*

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරනු ලබන ........................................... මයා/මිය/මෙනෙවිය හා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන බව ද ඔහු/ඇය ............................. වැනි දින මා ඉදිරිපිටදී ඔහු/ඇයගේ අත්සන තැබූ බව ද, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බව ද, එම ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.

.................................................
සහතික කරන්නාගේ අත්සන සහ නිල මුද්‍රාව.

දිනය :.................................................
සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :.................................................
තනතුර :.................................................
ලිපිනය :.................................................
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

(*සටහන* : අයදුම්පත්‍රය සමග විභාග ගාස්තුවට අදාළ ලදුපත හැරෙන්නට වෙනත් කිසිදු ලේඛනයක් අමුණා එවීම නොකළ යුතුය.)

10-442

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.